11 ශ්‍රේණිය

# ආහාරයේ ගුණාත්මකභාවය

10





W.D.වජිරා හේමමාලි
ගුරු උපදේශක ( කෘෂි විද්‍යා )

# නිපුණතා

- ආහාරයේ ගුණාත්මකභාවය අවබෝධ කර ගැනීම සඳහා යොදා ගත නිර්ණායක පැහැදිලි කිරීම.
- ආහාර බාල කිරීම හැඳින්වීම.
- ආහාර බාල කිරීම නිසා ඇති වන ගැටළු හඳුනා ගැනීම.
- ආහාර බාල කිරීම හඳුනා ගැනීම.
- ආහාරයක ගෝචර ලක්ෂණ හඳුනා ගැනීම.
- ආහාරයක ගෝචරතාව ඇගයීම සිදුකරන ආකාරය.
- ආහාර සම්බන්ධ ප්‍රමිති නම්කිරීම.
- ආහාර සම්බන්ධ ප්‍රමිතිවල වැදගත්කම පැහැදිලි කිරීම.

# ආහාරයේ ගුණාත්මකභාවය

- අප පරිභෝජනය කරන ආහාර පෝෂ්‍යදායී විය යුතු අතර ගුණාත්මකභාවයෙන් ඉහළ විය යුතුය.

- ආර්ථික වාසි ලබා ගැනීමේ අරමුණෙන් වෙළඳුන් ප්‍රමාණය හා පෙනුම වැඩිකර ගැනීම සඳහා විවිධ ද්‍රව්‍ය එකතු කරයි. එමගින් ආහාරයේ ගුණාත්මක බව අඩුවේ.

- පාරිභෝගිකයින්ට සිදුවන හානි අවම කර ගැනීම සඳහා ගුණාත්මක බවින් යුතු ආහාර හඳුනා ගනිමු.

# ආහාර බාල කිරීම / අපමිශ්‍රණය

ආහාර ද්‍රව්‍යයක ගුණාත්මය අඩු කිරීමට හේතු වන ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ එම ආහාර ද්‍රව්‍යයේ බහුල සංඝටකයක් ඉවත් කිරීම මගින් එහි පෝෂණීය අගය අඩු කිරීම ලෙස හැඳින්වේ.

## ආහාර බාල කිරීමේ අරමුණු

- ආහාර ද්‍රව්‍යයේ ප්‍රමාණය වැඩි කිරීම මගින් ලාභ ඉපයීම.
- ආර්ථික කටයුතු සඳහා ආහාර පරිරක්ෂණය.
- කෙටි කාලයකින් මුදල් ඉපයීම.
- ආහාරයට නැවුම් හා ස්වභාවික පෙනුමක් ලබා දීම.

# ආහාර බාල කිරීම නිසා ඇති වන ගැටළු

- ආහාරයක සෞඛ්‍යාරක්ෂිත බව අඩු වීම.
- පාරිභෝගිකයාට අයහපත් සෞඛ්‍යය තත්ත්ව ඇති වීම.

  (හිසරදය, ආමාශගත හා ආන්ත්‍රික ආබාධ, නිදිමත ස්වභාවය, මස් පිඩු වේදනාව)
- කහවලට මෙටැනිල් කහ වර්ණකය එකතු කිරීම නිසා නිරක්තිය, ඇස් නොපෙනීම හා ස්නායු ආබාධ ඇති වේ.
- ආහාර විෂ වීම, ආසාත්මිකතාවය.
- පිළිකා වැනි තත්ත්ව වලට ගොදුරු වීම.
- ජනතාවගේ ආර්ථිකය පිරිහීම (රෝගී වූ විට ප්‍රතිකාර ගැනීමට මුදල්, ශ්‍රමය වැයවීම නිසා)
- ජනතාවය පෝෂ්‍යදායී , ගුණාත්මක ආහාර නොලැබීම.

# නිෂ්පාදිත ආහාරයක පැවැත්ම



- ආහාරයේ සංයුතිය
- පාරිභෝගික රුචිකත්වය.
  - රසය
  - ගන්ධය
  - වයනය
  - පැහැය

අප පරිභෝජනය කරන ආහාර පෝෂ්‍යදායී විය යුතු අතර ගුණාත්මකභාවයෙන් ඉහළ විය යුතුය.





# ආහාර බාල කිරීම සිදුකරන අවස්ථා

- කහ කුඩුවලට තිරිඟු පිටි මිශ්‍ර කිරීම.
- සහල්පිටි හෝ කුරක්කන් පිටි තිරිඟු පිටි මිශ්‍ර කිරීම.
- කහ කුඩු වලට මෙටැනිල් කහ වර්ණක මිශ්‍ර කිරීම.
- ඉවතලන තේ කුඩුවලට කෘතිම වර්ණක මිශ්‍ර කිරීම
- කිරි හා වෙනත් පාන වර්ගවලට ජලය මිශ්‍ර කිරීම.
- ගම්මිරිස් බීජවලට පැපොල් බීජ මිශ්‍ර කිරීම.
- මිරිස් කුඩුවලට ගඩොල් කුඩු මිශ්‍ර කිරීම.
- කිරිපිටි වලට තිරිඟු පිටි මිශ්‍ර කිරීම.

# බාල කරන ලද ආහාර හඳුනා ගැනීම



ජලය මිශ්‍ර කරන ලද කිරි හඳුනා ගැනීම

# කෘත්‍රිම වර්ණක මිශ්‍ර කරන ලද තේ කොළ හඳුනා ගැනීම



පැපොල් බීජ මිශ්‍ර කරන ලද ගම්මිරිස් හඳුනා ගැනීම

පිරිසිදු මිරිස් කුඩු හඳුනා ගැනීම







# ආහාරයක ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම

**ආහාරයක ඉන්ද්‍රියගෝචරතාව යනු මිනිසාගේ සංවේදි ඉන්ද්‍රියයන් මගින් ලබාගන්නා සංවේදන ආශ්‍රයෙන් ලබාගන්නා හැඟීම් වේ.**

ආහාරයක් අනුභව කිරීමට පොළඹවන සාධක,

රසය - දිව
පෙනුම - ඇස
සුවඳ - නාසය
ස්පර්ශ කළ විට දැනෙන ස්වභාවය (රළු/ සියුම්) - සම
හපන විට ඇසෙන හඬ - කණ


පෙනුම
වර්ණය
ප්‍රමාණට
වයනය
හැඩය
දීප්තිය
සගන්ධය
වාෂ්පශීලී ද්‍රව්‍ය
රසය
තිත්ත
අඹුල්
අඹුල්
උණුසුම
වයනය
උණුබව
ලුණු
ලුණු
සිසිල්බව
පැණි රස
ශබ්දය
බුබුලු දැමීම
පොප් හඬ

# ඉන්ද්‍රිය ගෝචර ඇගයීමේ වැදගත්කම

- ආහාරයක ගුණාංග හා එහි ස්වභාවය හඳුනා ගැනීම.
- ආහාර වර්ග කිහිපයක තත්ත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය ගුණාංග හඳුනා ගැනීම.
- යම් ආහාරයක් නිෂ්පාදනයට සුදුසු නුසුදුසු බව තීරණය කිරීමට.
- අවශ්‍යතාවය අනුව ආහාරය නිෂ්පාදනය සිදුවීම සිදුවීම පිළිබඳ නිගමනය කිරීම.
- නව නිෂ්පාදනයක් හඳුන්වාදීමේදී ගුණාත්මය පිළිබඳ පාරිභෝගික කැමැත්ත දැන ගැනීම.
- ආහාර තත්ත්ව පාලනයේදී ආහාරයේ තිබිය යුතු නියමිත තත්ත්ව තිබේදැයි පරීක්ෂා කිරීම.
- ආහාරයක ජීව කාලය ගණනය කිරීමේදී ආහාරයක් නිෂ්පාදනය කළ මොහොතේ සිට එහි ස්වභාවය නොවෙනස්ව උසස් තත්ත්වයෙන් තබා ගත හැකි උපරිම කාල සීමාව තීරණය කිරීම.

# ආහාරයක ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම

- විශේෂිත පරීක්ෂණාගාරයක්
- පුහුණු කරන ලද පුද්ගලයන් කණ්ඩයම්









# ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම සඳහා යොදා ගන්නා පරීක්ෂණාගාරයක තිබිය යුතු ලක්ෂණ

- ශබ්ද හා විවිධ ගන්ධයන්ගෙන් තොර වීම.
- එක් එක් පුද්ගලයාට වෙන් කරන ලද ස්ථාන තිබීම.
- එම පරිසරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 18 හා 21 අතර මෙන්ම ආර්ද්‍රතාවය 40 % පමණ වීම.
- අවශ්‍ය උපකරණ හා ආහාර සාම්පල නිසි ලෙස සූදානම්කර තිබීම. (අක්‍රමවත් පිළිවෙළට අංක 3 ක් සහිත නොම්මර යෙදූ බඳුන්වල ආහාර බහා ඇත.)
- භාවිත කරන ඉන්ද්‍රිය ගෝචර පරීක්ෂණ වලට අනුකූලව දත්ත සටහන් පත්‍රිකා තිබීම.

# ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම සිදුකරන ආකාර

- ✓ තොරතුරු පත්‍රිකා ලබාදීම.
- ✓ අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ✓ ආහාර නියැදි පරීක්ෂා කිරීමට ඉඩ සැලසීම.

# තොරතුරු පත්‍රිකාව

**දත්ත ඇතුළත් කිරීමේ ආකෘති පත්‍රය**

නම -

සාදන ලද පළතුරු බීම වර්ග තුනෙහි සාම්පල ඔබට සපයා ඇත. ඒවායේ ඉන්ද්‍රිය ගෝචර ලක්ෂණ සලකා බලා ඒ සඳහා ඔබගේ ඇති කැමැත්ත/අකැමැත්ත අංක භාවිත කර දක්වන්න.

ඉතා හොඳයි - 7
හොඳයි - 6
තරමක් හොඳයි - 5
මධ්‍යස්ථයි - 4
තරමක් අකැමැතියි - 3
අකැමැතියි - 2
ඉතා අකැමැතියි - 1

| නියැදි අංකය | ආහාරයේ ඇති ගුණය | | |
|---|---|---|---|
| | රසය | පැහැය | වයනය |
| 212 | | | |
| 110 | | | |
| 325 | | | |

වෙනත් යෝජනා -

..........................................................
අත්සන

# ආහාර සම්බන්ධ ප්‍රමිති

පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සදහා සකස් කරන ලද ගුණාංග සමුදායක් ප්‍රමිතියක් ලෙස හැදින්වේ.

# අභ්‍යාස-

1. ආහාර ප්‍රමිතිවල වැදගත්කම සඳහන් කරන්න.
2. ළමුන් සඳහා නිෂ්පාදිත යම් විස්කෝතු වර්ගයක ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම සඳහා ඉන්ද්‍රිය ගෝචරතා පරීක්ෂණයක් සඳහන් කරන්න.

# ස්තූතියි....





